කො/දේවි බාලිකා විද්‍යාලය - කොළඹ
පළමු වාර පරීක්ෂණය - 2016 (මාර්තු)

සිංහල භාෂාව හා සාහිත්‍යය - I

11 ශ්‍රේණිය කාලය පැය 2 යි

- අංක 1 සිට 3 තෙක් ප්‍රශ්න වල එක් වාක්‍යයෙහි තද කළු අකුරින් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන වචනය තෝරන්න.

01) ලිපිකරුවා වඩින නිවසට පැමිණ මුදලාලිගේ ගැටයට අසු වුණා යැයි බිරිඳට පැවසීය.
1. මං මුලා වී සිටියදී කරදරයකට පත්වීම
2. අසත්‍ය ප්‍රකාශයකට සවන්දීම
3. උපායකට ගොදුරු වීම
4. සොරකමකට හසුවීම

02) සුවිමල්ගේ එකම පුතා එකා යකා වීම ගැන නිතර ඔහු දුක් විය.
1. යක්ෂ දිෂ්ටියක් ඇතිවීම
2. කපටි වැඩ කිරීම
3. එකම පුතා අකීකරු වීම
4. දෝෂාරෝපණවලට ගොදුරුවීම

03) අමල්ගේ විභාගය වෙනුවෙන් කළ වියදම් ගල මතුපිට වී වැපිරුවා වැනි යැයි පියා කණ ගැසුවේය.
1. ගලහි මඩ දමා වී වැපිරීම
2. එලක් නොලැබිය හැකි වැඩක් කිරීම
3. අකටයුත්තක් කිරීම
4. බලාපොරොත්තු ඉටු නොවීම

- අංක 4 සිට 6 තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.

04) සිරිමාගේ .................................... භාවය රැකියාව අහිමිවීමට හේතුවක් විය.
1. සංකුලබව
2. ආලස්‍ය බව
3. නින්දිත බව
4. දුර්දාන්ත

05) නිවසේ සිරියාව ඇයට ගෙනදෙන්නකි.
1. අමෝස
2. අමෘත
3. අමෝදය
4. අමේය

06) අකාරාදි පිළිවෙළ නිවැරදිව යෙදී ඇති පද පේළිය තෝරන්න.
1. නිශ්චල, ආශ්වාස, චර්යාව, ප්‍රගමනය
2. කාංචන, බහිරඩ්ඩා, වයලීනය, සන්හිඳ
3. නාරිලතා, කණිසම, ඇතින්න, කාව්‍යය
4. බවලතා, අස්බමරු, නිරුදක, වාහනය

- සෑම පදයකම අක්ෂර වින්‍යාසය නිවැරදිව යෙදී ඇති පද පේළිය තෝරන්න.

07)

1. අභිකුන්ඨික, ජ්‍යේෂ්ඨ, තැඹිලි, තක්ෂණය
2. තර්කානුකූල, පාතාළය, බේධවාචකය, දළ දාව
3. දර්පණය, අවනද්ධ, දශකය, මිනිබිරිය
4. අශික්සිත, කුෂ්ඨරෝග කුලුබඩු, ආඝ්‍රාණ

08) අනතර්ථ සමාසයට උදාහරණයක් වන්නේ

1. බරනෙත්
2. කුපුරිස්
3. මිහිදුම්
4. නිරවුල්

09) <u>සුජාත</u> දියණිය වූ ඇය කාගේත් ප්‍රශංසාවට ලක්විය. සුජාත යනු,

1. ක්‍රියා පදයකි
2. අව්‍ය පදයකි
3. තද්ධිත පදයකි
4. සර්වනාම පදයකි

10) උක්ත නාම පද පමණක් යෙදී ඇති වරණය තෝරන්න.

1. මඩුවකු, කාන්තාවක්, නයි, මුගටින්
2. බැල්ලක්, කුනිස්සෙක්, නරි, කොවුල්ලු
3. ඔවුන්, ගංගාවෝ, දරුවන්, කුරුල්ලකු
4. මාලිගාවෝ, වැද්දන්, පිහිනුම්කරුවෝ, ජලධාර

11) උපසර්ගයක් රහිත පදයක් ඇති වරණය තෝරන්න.

1. සුබස, උපචාර, පස්විකා, සතොස
2. නිකෙලෙස්, නොමනා, අසනීප, අබිදම්
3. අදියුරු, අබිසෙස්, විපුල, කුදිටු
4. ඉකුත්, පබල, උපුල්, පසක්

The National e-Learning Portal for The General Education

12) ජීවිතය ඇති තාක්කල් යන්නට තනිපදය වන්නේ

1. සදාකාලික
2. යාවජීව
3. දිවිකල්
4. සදාතනික

- අංක 13 සිට 14 තෙක් ප්‍රශ්නවල තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.

13) ස්වාමීන් වහන්සේ වැඩ වාසය කළේ <u>ආරාමික</u> ප්‍රදේශයක ය.

1. ගං ආරකට අයත් ප්‍රදේශයක
2. මුවදොරක
3. ආරාමයට අයත්
4. නිසසල ප්‍රදේශයක

14) නිවස අලංකරණය සඳහා <u>බුමුතුරුණු</u> යොදා තිබුණි.

1. තොරණක්
2. බිමට දැමූ ඇතිරිල්ලක්
3. පියගැටපෙළක්
4. කැටයම් කළ පාෂාණයක්

15) පැරණි නගර ආරක්ෂාව සඳහා වටේට මොහොරක් සකස් කෙරිණි.

1. දිය අගලක්
2. තාප්පයක්
3. වැටක්
4. ඉණිමගක්

16) මුලින් දී ඇති ව්‍යාකරණ වර්ගයට අයත් නොවන පදයක් සහිත වරණය තෝරන්න.

1. කෘදන්ත - නටනු / රඟන / බලන / පරණ
2. විභක්ති - ගසෙන් / කරුණාවෙන් / එළදෙනට / මිතුරනි
3. සර්වනාම - ඌ / ඇයි / නුඹ / එහේ
4. සමාස - අධිපති / සියපත් / පොල්තෙල් / බුදුගුණ

17) ආගම සන්ධියට උදාහරණයක් නොදෙන පදයක් තෝරන්න.

1. සුවාසු
2. පුනරුත්
3. දෙවුර
4. සුදම්

18) මුලින් දී ඇති පදයට සමානාර්ථයක් නොදෙන පදයක් ඇතුළත් වරනය තෝරන්න.

1. බියකරු - භයානක/ භයංකර / භීෂණ / භීම
2. සුළඟ - නල / වාතය / අනල / මාරුතය
3. ජලය - දිය / උදක / අඹ / පැන්
4. කොණ්ඩය - කියඹු / කෙස් / මුහුළ / ඉසකේ

19) විරුද්ධාර්ථවත් පද යුගලයක් නොවන වරණය තෝරන්න.

1. කුලීන - කුලහීන
2. ආවරණ - අනාවරණ
3. සදාචාර - අනාචාර
4. කාල - අකාල

20) අසම්භාව්‍ය ක්‍රියාවක් යෙදී ඇති වාක්‍ය තෝරන්න.

1. මාමා සේවකයා ලවා වැඩ කරවයි.
2. සියලු සත්වයෝ නිදුක් වෙත්වා
3. අත සොලවුවහොත් කට සෙලවිය හැකිය
4. ලෙඩා කෙඳිරිගායි

21) වැරදි අදහස සහිත වරණය තෝරන්න.

1. සෝපද්‍ර යනු නිරුපද්‍ර යන වචනයේ විරුද්ධාර්ථ පදයයි
2. උපසර්ග වාක්‍යයක ඕනෑම පදයක අගයට යෙදේ
3. විචරධාරියා යනු තද්ධිත ප්‍රත්‍යය ඇති පදයකි
4. මු මුන් යනු සර්වනාම පදවේ

22) අනුනාසික්‍ය ශබ්ද පමණක් පිළිවෙලින් යෙදී ඇති වරණය තෝරන්න.

1. ඞ , ළ , ණ , න , ම
2. ඞ , ඤ , ණ , න , ම
3. න , ණ , ශ , න , ම
4. න , ඤ , ම , ඞ , න

* අංක 24 සිට 26 තෙක් ඇති ප්‍රස්තාව පිරුළුවලට වඩාත් ගැළපෙන අදහස සහිත වරණය තෝරන්න.

23) ගිය ලූලා මහ එකා

1. නායකයා නැතිව බැරිය
2. පොලඹ හිස දෙසයෙහි අසය ඉතා වැඩිය
3. ගමන ගියේ නායකයාය
4. කිසිදු බියක් සැකක් නැතිව ගියේය

24) බලු වල්ගේ බැඳි මීය වගෙයි

1. කඩා ගැනීමට අපහසුය
2. තමාටවත් අන් කිසිවකුටත් ප්‍රයෝජනයක් නොලැබිය හැකිය.
3. බල්ලාගේ වලිගය ආරක්‍ෂා වීමය
4. මීයා වටා තවත් බල්ලන් කැරකෙනවා ඇත

25) ජරමර අස්සේ බර කරත්ත

1. කරත්තය ශබ්ද කරමින් ගමන් කරයි.
2. කරදර පිට තවත් කරදර පැමිණීම
3. කරත්තය නැතිව කිසිවක් කළ නොහැකිය
4. 'බර බර' හඬින් කරත්තය දුවයි

* අංක 27 සිට 29 තෙක් ප්‍රශ්නවල ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍යය තෝරන්න.

26)

1. ඇතෙකුයි මුවෙකුයි ඈඩි මිතුරුකමින් සිටියේ ය.
2. සහකරුවා විසින් සහකාරිය අමතන ලද්දේ ය
3. අපි වැඩි දෙනෙක් සාහිත්‍ය හදාරමු
4. කාර්යාලයෙහි අද ලිපිකරුවන් නැත

27)

1. රැස්වීමට මිනිසුන් යනවා අපි දැක්කේ ය
2. රැස්වීමට මිනිසුන් යනවා අපි දුටුවෙමු
3. රැස්වීමට මිනිස්සු යනවා අපි දුටුවෙමු
4. රැස්වීමට මිනිසුන් යනවා අපි දැක්කෝ ය

28)

1. දරුවන් අනාගත පුරවැසියන් වෙති
2. දරුවෝ අනාගත පුරවැසියෝ වෙති
3. දරුවන් අනාගත පුරවැසියෝ වෙයි
4. දරුවෝ අනාගත පුරවැසියන් වූහ

* පහත දැක්වෙන වාක්‍යය ලේඛන ව්‍යවහාරයට හැරවූ විට වඩාත් නිවැරදි ලෙස ලැබෙන වාක්‍යය තෝරන්න.

29) නළුවෙක් හා නිළියක් වේදිකාවට ආවා

1. නළුවකු හා නිළියක වේදිකාවට ආහ
2. නළුවෙක් හා නිළියක් හා වේදිකාවක ආහ
3. නළුවකු හා නිළියක් වේදිකාවට ආවේ ය
4. නළුවෙක් හා නිළියක වේදිකාවට ආහ

4

30) පහත සඳහන් කවියේ තද කළු අකුරෙන් මුද්‍රිත පද සඳහා යෙදෙන අර්ථ පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.

<u>ජයවද්දුන</u> ඇනුමැති මැති යුත් පවර
<u>ඇපුවද්දුන</u> ගජ හස සෙන් පිරි නිතොර
<u>නොවද්දුන</u> සගමොය් චුනි දහමියර
<u>ජයවද්දුන</u> පුරවර මෙයැ දනු මිතුර

1. ජයවර්ධනය, සතුරකු පැමිනීම, නොවැරදීම, ජයවැඩීම
2. ජයවර්ධනය, සතුරු මර්දනය, නොවරදවා , ජයවර්ධන පුරය
3. ජයඝෝෂාව, සතුරු කලබලය, සැමදාම, ජයවර්ධන නුවර
4. ජය ලැබීම, සතුරු වර්ධනය, නැවැත්වීම, ජයවැසීමේ නුවර

31) රූපකයක් සහිත වරණය තෝරන්න.

1. රිදී දිය දහරක්සේ ගලා එන
2. වන කොමලිය ඉඟි බිඟි බානා
3. පසලොස්වක සඳවාගේ එළිය ගෙනෙනවා
4. දිසි රන ලියෙව් රුසිරි යුත් මෙපුරඟන

32) ළු ,ඥ අක්ෂර දෙකෙහි සම්මිශ්‍රණ සංයෝගය වන්නේ,

1. ල් + උ ජ් + ඣ
2. ළ් + උ ජ් + ඤ
3. ළ් + උ ජ් + ඤ
4. ළ් + ශු ජ් + ණ

- පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

13 වන සියවසේ සිට කලක් යන තෙක්ම පද්‍ය බන්ධනය සඳහා අකුරු තිහකින් යුත් ශුද්ධ සිංහලය භාවිත වනු දක්නට ලැබේ. ලුහුගුරු වශයෙන් අකුරක දිග-කොට ස්වරූපය වැදගත් වන්නේ ද කාව්‍ය බන්ධනයේ දී මිස ගද්‍ය ලේඛනයේදී නොවේ. එ කෙසේ වෙතත් 13 වන සියවසේ හඳුන්වාදුන් යථෝක්ත සිංහල හෝඩිය වර්තමාන අදහස් ප්‍රකාශ කිරීමේලා ඒ තරම් පොහොසත් නොවන බව කිව යුතු ය.

33) මෙම කොටසෙන් කියැවෙන්නේ

1. කාව්‍ය සඳහා ගද්‍ය රීතිය අවශ්‍ය බවයි
2. කාව්‍ය බැඳීම සඳහා ශුද්ධ සිංහලය අවශ්‍ය වූ බවයි
3. සිදත් සඟරාවේ අක්ෂර 30 ක් ඇති බවයි.
4. සිදත් සඟරා හෝඩිය වර්තමානයට නොගැළපෙන බවයි

34) ලුහු, ගුරු යනුවෙන් හඳුන්වන්නේ

1. අකුරේ වට ප්‍රමාණ හැඩයයි
2. අකුරක මාත්‍රාවල පිහිටීමයි
3. අකුරක දිග හා කෙටි ස්වරූපයයි
4. අකුරක කෙටි හා දිග් ස්වරූපයයි

35) ශුද්ධ සිංහල හෝඩියේ ගාත්‍රාක්ෂර

1. 32 කි
2. 30 කි
3. 20 කි
4. 18 කි

36) රියෝහෙයි, ෂවුවා, තුවාන්, බුහාර්නුද්දීන්, ක්‍රිස්ටෝපර් , විලියම් වීජේකෝන්, යනාදීන් ගැන පිළිවෙළින් දැක්වෙන්නේ කිනම් පිළිතුරේ ද ?

1. හුණුවටයේ කතාව, තොරක්කෝව, සී.ඩබ්.ඩබ්.කන්නන්ගර, ටී.බී. ජයා
2. තොරක්කෝව, සියදෝරිස් ව්‍යාපාරය - ටී.බී. ජයා
3. තොරක්කෝව, හුණුවටය, ටී.බී. ජයා , සී.ඩබ්.ඩබ්. කන්නන්ගර
4. හුණුවටයේ කතාව , තොරක්කෝව, ටී.බී. ජයා , සියදෝරිස් ව්‍යාපාරය

37) අමාවතුර, බුත්සරණ, පූජාවලිය කෘතීන්ගේ ලේඛන රීතිය පෙන්වීම සඳහා යොදාගත් අවස්ථාව වන්නේ,

1. අලවු යකු දමනය
2. චිංචිමානවිකා දමනය
3. අංගුලිමාල දමනය
4. නාලාගිරි දමනය

38) පහත සඳහන් කවියේ හතරවන පදය වන්නේ

වඩිමින් සවස නල හැසිරෙන දිගතු වල
සොබමන් සුනිල් මිණි නිල් නුඹතුර විපුල
පතසන් අවර ගිර හැටියෙන් වැටෙන කල
........................................................................

1. උදුල සොම් කැලුම් නිසයුරු හිමි පුවල
2. අතුල කුසුම් විලසින් සැදෙත තුරු වැල
3. විලිකුන් සුරත් එල වැනිවේ රිවි මඩල
4. ලකළ ගුවන් තල සිරි යහන නිකසළ

39) ඉරරාජ යනු

1. උතුරු පළාතේ පිහිටි නගරයකි
2. ගොඩබිම පමණක් වැඩෙන ඕකිඩ් පැළයකි
3. සර්පයකුගේ අන්වර්ථ නාමයකි
4. හිරුගේ පැහැය ඇති ශාඛයකි

40) "එම්බල පුරුෂය තා කෙරෙහි මම සැක ඇත්තෙමි"
ඉහත උද්ධෘතය ඇතුළත් වන්නේ

1. සද්ධර්මාලංකාරයේ
2. රාජාවලිය
3. පන්සිය පනස් ජාතක කතාවේ
4. සද්ධර්ම රත්නාවලිය

The National e-learning Portal for The General Education

කො/දේවි බාලිකා විද්‍යාලය - කොළඹ
පළමු වාර පරීක්ෂණය - 2016 (මාර්තු)

සිංහල භාෂාව හා සාහිත්‍යය - II

11 ශ්‍රේණිය කාලය පැය යි

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

01) අංක 1 සිට 10 තෙක් දක්වා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

1. අ) අන්තඃස්ථාක්ෂර දෙකක් යොදා එක් වචනයක් ලියා දක්වන්න.

   ආ) ඕෂ්ඨජ අක්ෂර දෙකක් ලියන්න.

2. අ) පහන , යහපත යන පදවල ප්‍රකෘති වෙන්කර ලියන්න.

   ආ) 'කප' යන ධාතු ප්‍රකෘතිය යොදා ප්‍රයෝජ්‍ය ක්‍රියා පදයක් ලියන්න.

3. පහත පද විසන්ධි කරන්න.

   අ) රුවනාර

   ආ) පිළිතුරු

4. පහත වාක්‍යයේ ඉරිගසා ඇති පදවල ව්‍යාකරණ වර්ගය නම් කරන්න.

   නංගී උදෑසනම <u>අවදි වී</u> පාසලට ගියා ය. ඇය <u>ආවොත්</u> මම නගරයට යන්නෙමි.

5. පහත වාක්‍ය කර්මකාරකයට හරවන්න.

   අ) ගුරුතුමිය ශිෂ්‍යයා කැඳවයි

   ආ) නිලධාරීහු සේවකයන්ගේ වැඩවර්ජනය අත්හිටවයි.

6. පහත පදයට ගැළපෙන බහුඅර්ථ පද දෙකක් ලියන්න.

   ▪ වන

7. පහත පදවලට සමාන පද ලියන්න.

   අ) දියනෙත

   ආ) වරනිඳු

8. 'දෙහි කැපුවා' යනු බැණවැදුනා නම්

   'විනාශය ළංවෙලා' යන්නට ගැළපෙන ඉඟි වැකිය ලියා දක්වන්න.

9. කලක් සතුරු ව සිටි අය පවා පසුව මිතුරන් වන බව යන්නට ගැළපෙන පිරුළ ලියා දක්වන්න.

10. මොනරාගල ප්‍රදේශයේ පහත සඳහන් පද සඳහා භාවිත වන වචන ලියන්න.

    අ) නිදාගත්තා

    ආ) විසිකළා

(ලකුණු 20)

The National e-learning Portal for The General Education

02) පහත දැක්වෙන අ , ආ , ඉ , ඊ යන විස්තර අතුරෙන් එකක් තෝරාගෙන වචන 250 කට නොඅඩු රචනයක් ලියන්න.

අ) ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් වැඩි කොටසක් ගම්බද ප්‍රදේශවල ගොවිතැන් කටයුතු කරමින් ජීවත්වෙති. ගොවිතැනින් තම ආර්ථික රටාව ගොඩනංවා ගැනීමට හැකිවෙන අතර ම රටේ සංවර්ධනය සඳහා ද දායක විය හැක. දියුණු වෙමින් පවතින රටක් ලෙස මෙම ප්‍රවණතාවය ශ්‍රී ලාංකිකයින්ට හිතකර වුවද තරුණ පරපුර මේවායින් ඈත්වී නාගරික ප්‍රදේශවල විවිධ රැකියා සඳහා යොමුවේ. මෙහි ඇති අහිතකර තත්ත්වය රටට කෙසේ බලපාන්නේදැයි විගකිව යුත්තෝ සොයා බැලිය යුතු ය.

ආ) ලෝකය දියුණුවෙන් ඉදිරියට යන විට තාක්ෂණයේ දියුණුව කෙරෙහි වැඩි අවධානයක් යොමුවේ. එම දියුණුව හේතුවෙන් රටවල් අතර ඇති විවිධ සම්බන්ධතා ගොඩනගා ගැනීමට ද හැකියාව ඇත. නමුත් මෙය අහිසි ලෙස භාවිත කිරීමෙන් තරුණ හා ළමා පරපුර නොමගට යෑම වැඩි වී ඇත. එය ලෝක සංවර්ධනයට ද බෙහෙවින් බලපානු ලැබේ. අනාගත ලෝකය ජය ගැනීමට සිටින මේ පිරිසේ තාක්ෂණික දැනුම යහපත උදෙසා යෙදවීමට කටයුතු කරමු.

ඉ) ගංගා, ඇල, දොළ, කඳු , වනාන්තර ආදි ස්වභාවික සම්පත් තුළින් රටක අලංකාරය දෙගුණ තෙගුණ වේ. නමුත් වෙනස් වෙන ලෝකයත් සමග පරිසරය ද වේගයෙන් වෙනස් වීමට පටන් ගෙන ඇත්තේ මිනිස් ක්‍රියාකාරිත්වයේ ප්‍රතිඵල මත ය. විවිධාකාර ව්‍යාපෘති හේතුවෙන් විනාශ වී යන සෞන්දර්ය නැවත ඇති කිරීමට ක්‍රියා නොකළහොත් මුළු ලොව ඉතා ඉක්මනින් කාන්තාර බවට පත්වීමට ඇති ඉඩ ප්‍රස්තාව වැඩිවේ. මේ සඳහා පිළියම් යෙදිය යුතු කාලය එළඹ ඇත.

ඊ) රූපවාහිනිය, ගුවන් විදුලිය, පුවත්පත් ආදි සාමාන්‍ය ජනයා අතර පවතින ප්‍රබල සන්නිවේදන මාධ්‍යයන් තුළින් ජනතාව බලාපොරොත්තු වන්නේ නිවැරදි තොරතුරු සාරධර්මයන්ගෙන් පිරි ලිපි හා සිදුවීම් ය. නමුත් අද වන විට මෙම සන්නිවේදන මාධ්‍යයන් තුළින් සමාජ විරෝධී සහ ළමා මනසට නොගැලපෙන හොර, වංචා ආදි සිදුවීම් එළි දැක්වේ. මේවායෙහි ඇති බරපතල බව වන්නේ එවැනි ක්‍රම අනුගමනය කරමින් වැරදි මගට අවතීර්ණ වීමට සමාජයේ යම් පුද්ගලයන් උත්සහ දැරීමයි. මේ සඳහා වාරණ නීති පැනවීමට හැකි විය යුතු ය.

(ලකුණු 25)

03) පහත දැක්වෙන පාඨය වචන 40 - 45 අතර ගණනකින් යුක්තවන සේ සාරාංශ කොට ලියන්න. ඔබේ සාරාංශයේ වචන ගණන උත්තරය අග ලියන්න.

ජනකවි ඇසුරින් කාව්‍ය සම්ප්‍රදායක් සකස් කිරීමේ කාර්යය බොහෝ දුරට සාර්ථක වුව ද ඇතැම් විට ඊ සම්බන්ධ ප්‍රශ්න කීපයක් නැගෙයි. මෙම සම්ප්‍රදාය අනුගමනය කරන ඇතැම් කවිහු ජන කවියේ භාවිත වන වචන ඒ ආකාරයෙන් ම ගෙන වර්තමාන අත්දැකීමකට කෙළින් ම සම්බන්ධ කිරීමට උත්සහ ගෙන ඇත. ජන කවීන් වචන භාවිත කර ඇත්තේ ඔවුන්ගේ නිර්ව්‍යාජ හැඟීම් එම වචනවලින් ඉබේම ධ්වනිත වූ හෙයිනි. එහෙත් එම සම්ප්‍රදාය අනුගමනය කරන ඇතැම් කවිහු එමින්නේ, යමින්නේ, වරෙන්නේ, කරවාපන්නේ, පෙතිගෝමර වැනි එතරම් අර්ථවත් නැති පද පමණක් සංකලනය කර කාව්‍ය නිර්මාණය කරති. ඔවුහු එම කාව්‍යවල නිර්ව්‍යාජත්වය වැනි අභ්‍යන්තරික ලක්ෂණවලින් ආභාසය නොලබති. ජනකවීන් භාවිත පද හරඹයක් පමණක් කිරීමෙන් නව පද්‍ය සම්ප්‍රදායක් ගොඩනැගිය හැකි නොවේ. නන්දසේන රත්නපාලගේ "මරණින් එහා" නමැති පද්‍ය සංග්‍රහයේ ඇතැම් පද සලකා බැලීමේදී මෙම කරුණු පැහැදිලි වේ.

(ලකුණු 10)

04) පහත කවි කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

විසිතුරු වැලි නොම ඳ
තිසර විලිකුළු දෙන නඳ
මලින වල පිය ග ඳ
සිපාගඟ දිවි කුමරු දිය බ ඳ

හෙල්මැලි ඇඹුලපු ළු
පියුම් මුවරද බඳ ලො ළ
අඳුරු කර මිහිලො ළ
නදින් නිරතුරු එගඟ කොලහ ළ

1. මෙහි මුල් කවියේ පළමු පද පේළියේ අර්ථය ලියන්න.
2. කවි පංතියේ සඳහන් නාද කරන පක්ෂීන් දෙදෙනා කවුද ?
3. මෙහි ඇති සන්ධි පදය සොයා විස්තර කර ලියන්න.
4. පහත වචනවලට සමාන පදය බැගින් ලියන්න.
   1) පියුම් 2) මුවරද
   3) මිහිලොල් 4) නදින්

(ලකුණු 10)

05) රන්පොකුණගම විද්‍යාලයේ ක්‍රීඩා සංගමයේ ලේකම් වසන්ත පෙරේරා ඔබයැයි සිතා පාසලට අවශ්‍ය ක්‍රීඩා භාණ්ඩ (දැල් පන්දු, අත්පන්දු ආදි) ඉල්ලා ක්‍රීඩා අමාත්‍යතුමාට යවන ලිපිය ලියන්න.

නැතහොත්

ක්‍රීඩා උත්සවය පිළිබඳ පාසලේ ශිෂ්‍යයින් දැනුවත් කරන අත්පත්‍රිකාව සකස් කරන්න.

(ලකුණු 15)

The National e-learning Portal for The General Education

කො/දේවි බාලිකා විද්‍යාලය - කොළඹ

පළමු වාර පරීක්ෂණය - 2016 (මාර්තු)

සිංහල භාෂාව හා සාහිත්‍ය - III

11 ශ්‍රේණිය

කාලය පැය 02 යි

01) (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

i. "තෝ දියෙන් යන්නෙහි මූට කුමක් කී ද ?

අ) මෙසේ අසන්නේ කවුද ?

ආ) 'මූට' යනුවෙන් හඳුන්වන තැනැත්තා කවුද ?

ii. 'මං අහපු ආරංචියක් නැහැ. කාගෙන් ද ආරංචි අහන්නේ ?

අ) මෙසේ කීවේ කාටද ?

ආ) මෙසේ කියන්නේ කවුද ?

iii. ජාතිය රන් විමනක් වේ

ආගම මිණි පහනක් වේ

....................................................

....................................................

අ) මෙහි ඉතිරි පද දෙක ලියන්න.

ආ) මෙම කවියෙහි දැක්වෙන කාව්‍යාලංකාරය කුමක්ද ?

iv. පටහැණි වෙන්ටා නොව ඔහු අණටා

වෙන මඟ ගැලවෙන්ටා ......

අ) මෙය සඳහන් පාඨම කුමක් ද ?

ආ) මෙසේ කියන්නේ කවුද ?

v. 'වහන්සේ මට දැහැමි රජ කෙනෙක් ඇත්තාහු නොවෙති'

අ) 'දැහැමි' යන්නෙහි අර්ථය ලියන්න.

ආ) මේ පාඨය සඳහන් මුල් ග්‍රන්ථය කුමක් ද ?

vi. සතොස් කරන වීණා නද ඇසුමට

නොගොස් සිටින පිල්බර ගණ ගොදුරට

වෙසෙස් රුවින් තම මැවුවත් බඹහට

....................................................

අ) මෙහි ඉතිරි පදය ලියන්න.

ආ) මෙම කාව්‍ය ඇතුළත් ග්‍රන්ථය රචනා වූයේ කිනම් යුගයක ද ?

vii. ගංගාවේ සංගීතය පද්‍ය පන්තියේ

අ) රචකයා කවුරුන්ද ?

ආ) එම රචකයාගේ වෙනත් කාව්‍ය නිර්මාණ 2 ක් ලියන්න.

viii. 'උග්ගසේන නම් සිටුපුත්‍රයාගේ වස්තුව' පාඩම

අ). උපුටාගත් ග්‍රන්ථය කුමක්ද ?

ආ) එහි කතුවරයා කවරෙක්ද ?

ix. පහත සඳහන් පඬිවරුන් සේවය කළේ කවර රජවරුන්ට ද ?

අ) කේවට්ටාචාරීන් -

ආ) මහෞෂධ පඬිතුමා -

x. පහත සඳහන් ග්‍රන්ථ රචනා කවර යුගවල දී ද ?

අ) හංස සන්දේශය -

ආ) ජාතක පොත් වහන්සේ -

02) පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨවල තද කළු අකුරෙන් මුද්‍රිත කොටස්වල අර්ථය වෙන් වෙන්ව ලියන්න. ඉන් පසු මුළු කොටසේ ම අර්ථය ලිහිල් බසින් ලියන්න.

i. ආරච්චි මායියා හැමදාමත් කීවේ මේ ගම කිසි කලක කිසි කෙනෙකුට වගතුවක් නොවන සාපලත් ගමක් බවයි.

ii. ඉහ හැම අරණ්‍යයෙහි හසර නැති කෙළෙ දර පලා සඳහා වල් යන්නාහු නැති

iii. කැර මිණි බරණ රැස්
රසින් සුර සැවු සුවහස්
සුරන් සහ සහසැස්
නො කැර සිටියේ අහස් ඹුස සිස්

iv. කනක රජතාදීන් විචිත්‍ර වූ රක්ත නීලා දී වූ නා නා වස්ත්‍රයෙන් සමුජ්වලිත රථයෙහි නගන ලද ......

- 3 , 4 යන ප්‍රශ්නවලින් එක් ප්‍රශ්නයකටත් 5 , 6 , 7 ප්‍රශ්නවලින් එක් ප්‍රශ්නයකටත් පිළිතුරු ලියන්න.

03) පුංචි මැණිකාගේ 1) අභිංසකකමත්
2) ධෛර්යයක් බැද්දේගම නවකතාව තුළින් මනාව පැහැදිලිවේ. නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

නැතහොත්

i. මහෞෂධ පඬිතුමාගේ උපත කෞශල්‍යයත්
ii. කේවට්ට බමුණා උපහාසයට ලක්වීමත් උපාය පිළිබඳ ව සතර කන්මන්ත්‍රණය පාඩම ඇසුරෙන් විමසන්න.

04) ගුත්තිල කාව්‍ය 1) අර්ථ රසයෙන්

2) ශබ්ද රසයෙන් අනූනය. අදාළ කාව්‍ය ඇසුරෙන් මේ කියමන පැහැදිලි කරන්න.

නැතහොත්

i. ශෘංගාරස්ථානය නිසා ප්‍රමෝද සතුටක්

ii. විචිත්‍රවත් පරිසරයක ස්වභාවයත්

කෑරගලය වැජඹෙයි මේ ලෙසින් සිට පද්‍ය පන්තිය ඇසුරෙන් පැහැදිලි කරන්න.

05) ජන කවි තුළින් උපදෙස් දීමට ජනකවියා දැක්වූ දක්ෂතාව අදාළ කාව්‍ය පන්තියෙන් උදාහරණ සපයමින් පැහැදිලි කරන්න.

06) තරුණයෙකුගේ චිත්ත ස්වභාවය සිංහබාහුගේ චරිතය ඇසුරෙන් පැහැදිලි කරන්න.

07) උපන්බිමේ වටිනාකම මැනවින් පෙන්වා දෙමින් දේශානුරාගය ඇති කිරීමට කවියා දැක්වූ දක්ෂතාව මුනි සිරිපා සිඹිමින්නේ කාව්‍ය පන්තිය ඇසුරෙන් විමසන්න.